# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# දෙවන ජාතික භාෂාව (දෙමළ)

## පළමුවන ශ්‍රේණිය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

# විෂය නිර්දේශය
## දෙවන ජාතික භාෂාව (දෙමළ) - පළමුවන ශ්‍රේණිය

## 1.0 හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන්, තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීම තුළින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාවන් සිසුන් තුළ වර්ධනය කිරීම මෙ මඟින් බලාපොරොත්තු වේ.

මෙම අරමුණ ඇති ව දෙවන ජාතික භාෂාවක් ඉගැන්වීම තුළින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමටත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි ද අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පළමුවන ප්‍රධාන අවධිය තුළ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් සකසා ඇත.

මෙහි දී භාෂා ක්ෂේත්‍ර යටතේ සවන් දීම හා කතා කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර ඇති අතර දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී චතුර්විධ භාෂා ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීමට සැලසුම් කර ඇත.

### පළමුවන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව නිවැරදි ව හා සුහදශීලී ව ප්‍රකාශ කරයි.
- පාසලේ දී තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සුහද ව හා ආචාරශීලී ව ඉල්ලීම් කරයි.
- පාසලේ දී ලැබෙන විධානවලට අවනතව කටයුතු කරයි.
- තමාට සමීපතමයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- අංක හඳුනාගෙන පැහැදිලි ව හා නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට හඳුනාගෙන නිවැරදි උච්චාරණයෙන් යුතු ව නම් කරයි.
- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

### පළමුවන ශ්‍රේණිය සඳහා නිපුණතා

- යමෙකු හමුවීමේ දී හා වෙන් වීමේ දී ආචාරාශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමාගේ නම නිවැරදි ව හා සුහද ව ප්‍රකාශ කරයි.
- ආචාරශීලී ව හා සුහද ව තම පන්තියේ මිතුරන්ගෙන් ඉල්ලීම් කරයි.
- පන්ති කාමරයේ දී ගුරුවරයාගෙන් ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.
- තම සමීප යහළුවන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- 1 - 5 තෙක් අංක දෙමළ භාෂාවෙන් කියයි.
- පාට පහක් නිවැරදි ව ප්‍රකාශ කරයි.
- සරල කවි, ගී අංග චලනය සහිත ව ගායනා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

සැලසුම් ගත ක්‍රියාකාරකම් ඇසුරින් දෙවන ජාතික භාෂාවට අදාළ ව අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය ය. සිසුන් අදාළ නිපුණතා කරා ළඟා කර ගැනීමේලා යෝජිත ක්‍රියාකාරකම් යොදා ගැනීමට මෙන් ම අවස්ථාවෝචිත ව ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ද ඔබට නිදහස ඇත.

2007 වසරේ දී හඳුන්වා දීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව සිංහල සිසුන් සඳහා දෙමළ භාෂාවත්, දෙමළ සිසුන් සඳහා සිංහල භාෂාවත් දෙවන ජාතික භාෂාව වශයෙන් පළමුවන ශ්‍රේණියේ සිට ඉගැන්වීමට සැලසුම් කර ඇත. මෙය ක්‍රියාත්මක කළ යුතු ආකාරය සවිස්තරාත්මක ව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන ජාතික භාෂා කොටසට ඇතුළත් කර ඇත.

**නිපුණතාව**

- යමෙකු හමුවීමේ දී හා වෙන් වීමේ දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.

  tணக்கம் වණක්කම්

**නිපුණතාව**

- තමාගේ නම නිවැරදි ව හා සුහද ව ප්‍රකාශ කරයි.

  | | |
  |---|---|
  | நான் சமன் | නාන් සමන් |
  | எனது பெயர் சமன் | එනදු පෙයර් සමන් |

**නිපුණතාව**

- ආචාරශීලී ව හා සුහද ව තම පන්තියේ මිතුරන්ගෙන් ඉල්ලීම් කරයි.

  | | |
  |---|---|
  | எடுங்கள் | එඩුංගල් |
  | தாருங்கள் | තාරුංගල් |
  | போங்கள் | පෝංගල් |
  | வாருங்கள் | වාරුංගල් |
  | சொல்லுங்கள் | සොල්ලුංගල් |
  | கேளுங்கள் | කේළුංගල් |
  | பாடுங்கள் | පාඩුංගල් |
  | வையுங்கள் | වෛයුංගල් |
  | பாருங்கள் | පාරුංගල් |
  | எழுதுங்கள் | එළුදුංගල් |

**නිපුණතාව**

- පන්ති කාමරයේ දී ගුරුවරයාගෙන් ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.

  | | |
  |---|---|
  | எழும்புங்கள் | එළුම්පුංගල් |
  | இருங்கள் | ඉරුංගල් |
  | கை தட்டுங்கள் | කයිතට්ටුංගල් |
  | சிரியுங்கள் | සිරියුංගල් |

**නිපුණතාව**

- තම සමීප යහළුවන්ගේ තොරතුරු සුහද ව විමසයි.

  | | |
  |---|---|
  | உங்களது பெயர் என்ன? | උංගල් පෙයර් එන්න? |
  | உங்கள் ஊர் எது? | උංගල් ඌර්එදු ? |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව**

- 1 - 5 තෙක් අංක දෙමළ භාෂාවෙන් කියයි.

| | |
|---|---|
| ஒன்று | ඔන්රු |
| இரண்டு | ඉරණ්ඩු |
| மூன்று | මූන්රු |
| நாலு | නාන්කු/නාලු |
| ஐந்து | ඓංදු |

**නිපුණතාව**

- පාට පහක් නිවැරදි ව ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| நீல நிறம் | නීල නිරම් |
| மஞ்சள் நிறம் | මංජල් නිරම් |
| சிவப்பு நிறம் | සිවප්පු නිරම් |
| வெள்ளை நிறம் | වෙල්ලෙ නිරම් |
| கறுப்பு நிறம் | කරුප්පු නිරම් |

නිපුණතාව

- සරල කවි, ගී අංග චලනය සහිත ව ගායනා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.